*Archaeologia (2004) : 68 - 77*

# නකල්ස් කඳුකරය ආශ්‍රිත ප්‍රදේශයේ සාම්ප්‍රදායික චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ විමර්ශනයක්

**ශ්‍යාමලී රාජපක්ෂ**
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
e mail : shamiwr@yahoo.com

## හැඳින්වීම

පාරිසරික සාධක පදනම් කරගෙන දුම්බර කඳුවැටිය, බටදඹු කඳුවැටිය නමින් හැඳින්වූ නකල්ස් කඳුකරය ශ්‍රී ලංකාවේ හිම නොමැති ඇල්ප්ස් කඳුකරයක් හා සමානය (Cooray 1998, 15). ප්‍රධාන කඳුශිඛර පහකින් යුක්ත මෙය ශ්‍රී ලංකාවේ සුවිශේෂ භූ විෂමතා ලක්ෂණ හා භූ රූපණ ලක්ෂණ පෙන්නුම් කරනු ලබන අතර මධ්‍යම පළාතේ මහනුවර හා මාතලේ දිස්ත්‍රික්ක දෙකම සම්බන්ධ වන සේ වර්ග සැතපුම් හැට දෙකක භූමි භාගයක් පුරා ව්‍යාප්තව පවතී. මේ පාරිසරික පසුබිම නකල්ස් කඳුකරයේ මීමුරේ, කයිකාවල, ලග්ගල, දන්දෙණි කුඹුර, කොස්දණ්ඩ, ගලමුදුන, ගල දෙබොක්ක, වැනි ගම්මානවල සමාජීය හා සංස්කෘතික ලක්ෂණයන්හි සැකැස්මට දැඩිව බලපා ඇති බව පෙනේ.

ජනශ්‍රැති, ලිඛිත සාධක හා පුරාවිද්‍යාත්මක සාධක මත විවිධ පරිපාලන සමයන්හි රාජ්‍යාධිකාරයේ බලපෑම්වලට නතු වූ විශේෂයෙන් මහනුවර යුගයේ දේශපාලනික වශයෙන් සෘජු සම්බන්ධතා පැවැති මීමුරේ ගම්මානය හා අවට ගම්මානයන්හි මෑතක් වන තුරු ම පාරම්පරික සිරිත් විරිත් ශේෂ ව පැවතිණි. ස්වාභාවික දුර්ගමය පිහිටීම ආරක්ෂාවක් ව පවතින මේ ගම්මානවල එම ආරක්ෂාව නිසා ම නවීන ආකල්පවලට සැරිසැරීමට ඇති ඉඩ කඩ අඩුරාලන බවක් පෙනෙන්නට තිබේ.

කෙත, හේන, වැව කේන්ද්‍ර කොට ගත් සාම්ප්‍රදායික ජීවන රටාවකට උරුමකම් කී නකල්ස් වාසීන් උපතේ සිට මරණය තෙක් ම ගත කළ ජීවිතය එම රටාවට ම අනුරූප වූවකි. ඔවුන් බුදු දහමින් ලද උපරිම දායාදය වූයේ එහි දර්ශනය පාරම්පරික ජන ජීවිතයේ විවිධ අවස්ථාවන්ට අනුරූපව යොදා ගැනීමේ දී දක්‍ වූ දක්ෂතාවයයි. මේ අනුව මීමුරේ වැනි නකල්ස් කලාපයේ ගම්මානවල ජීවත් වන ගැමියන් සිය ලෞකික ජීවිතයේ විවිධ අවධීන්වලට එළඹීමේ උත්සවයන් අර්ධ ආගමික මුහුණුවරකින් යුක්තව ගොඩ නගා ගැනීමක් දක්නට ලැබේ. ඒ අනුව ඔවුන් උපත, ඉඳුල්කට ගෑම,